# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.08.25 පැය 1535 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/'1643/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


### කායවඩර්න තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.

International Fitness and Bodybuilding Federation සංගමය මඟින් සංවිධානය කරනු ලැබූ 2025 Mr. Universe කායවඩර්න තරඟාවලිය 2025.08.23 හා 2025.08.24 යන දෙදින තුළ තායිලන්තයේ දී පවත්වන ලද අතර මෙම කායවඩර්න තරඟාවලිය සඳහා රටවල් 30ක ක්‍රීඩා කණ්ඩායම් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 150කට අධික සංඛ්‍යාවක් සහභාගි වී ඇත.

මේ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් සැරයන් 12190 කේ. ඩී. මායාදුන්න නිලධාරියා සහ පොලිස් කොස්තාපල් 89528 ජී.ඩී. වනිගසේකර යන නිලධාරින් මේ සඳහා සහභාගි වන ලදි.

මෙහිදී, Body building and physics කාණ්ඩයෙන් තරඟය සඳහා සහභාගි වූ පොලිස් සැරයන් 12190 කේ. ඩී . මායාදුන්න නිලධාරියා වයස අවුරුදු 40 සහ 49 අතර තරඟ කාණ්ඩයේ ප්‍රථම ස්ථානය, Master Overall තරගයෙන් ප්‍රථම ස්ථානය, 70kg - 80kg බර පන්තිය යටතේ තරඟ කාණ්ඩයෙන් ප්‍රථම ස්ථානය, Bodybuilding Overall තරඟයේ තෙවන ස්ථානය හා මාස්ටර් අංශයේ දක්ෂතම ක්‍රිඩකයාට පිරිනැමෙන Pro Card දිනා ගැනීමට මෙම ක්‍රිඩකයා සමත්ව ඇත.

තවද පොලිස් කොස්තාපල් 89528 ජී.ඩී. වනිගසේකර නිලධාරියා වයස අවුරුදු 40ට වැඩි physique උස 173cm ට අඩු තරඟ කාණ්ඩයේ ප්‍රථම ස්ථානය, Fit Modal තරඟ කාණ්ඩයේ දෙවන ස්ථානය හා උස 173cm ට අඩු විවෘත තරඟ කාණ්ඩයේ තෙවන ස්ථානය ද හිමි කර ගැනීමට සමත්වී ඇත.

පොලිස් කායවඩර්න කණ්ඩායමේ සභාපති ලෙස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මහතා කටයුතු කරන අතර ලේකම් ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඩී.ජී.එච්. ප්‍රශාන්ත මහතා කටයුතු කරයි. කලමණාකරු ලෙස උප පොලිස් පරීක්ෂක කේ. බි. එන්. කොඩිතුවක්කු හා පුහුණුකරු ලෙස දුමිත් සිල්වා යන නිලධාරීන් කටයුතු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**